# බෞද්ධ ඉගැන්වීම්හි අන්තර්ගත පරිසර සංරක්ෂණය: විමර්ශනාත්මක අධ්‍යයනයක්

බඩල්කුඹුරේ සුබෝධි හිමි [1]

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් සියලු ම ජීවීන්ගේ යහපැවැත්ම උදෙසා සොබාදහම නිහඬ අනුපමේය කාර්යභාරයක් ඉටු කරයි. වර්තමාන සමාජය තුළ නාගරීකරණය, කාර්මිකකරණය හා ගෝලීයකරණය ආදී විවිධ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පරිසරයට සිදුවන හානිය ගණනය කළ නොහැක. මෙවනි ක්‍රියාකාරකම් මගින් සිදුවන ස්වභාවික ව්‍යසනයන් හා පරිසර සංරක්ෂණ ක්‍රමෝපායන්හි වැදගත්කම පිළිබඳ ව සිතීමට සමස්ථ මානව ප්‍රජාව වෙත පරිසරය තුළින් ම අවකාශය සළසා ඇත. මෙවන් පසුබිමක පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පරිසරයේ භෞතික අභිවෘද්ධිය උදෙසා උපයෝගී කර ගැනීම අන් කවරදාටත් වඩා වැදගත් වේ. මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ බුදුදහමෙහි අන්තර්ගත පාරිසරික සංරක්ෂණ ක්‍රමෝපායයන් පිළිබඳ ව විශ්ලේෂණාත්මකව අධ්‍යනය කිරීම යි. මෙම පර්යේෂණයේ දත්ත රැස්කිරීම සාහිත්‍ය මුලාශ්‍රය අධ්‍යයනය මගින් සිදු කෙරේ. බෞද්ධ ඉගැන්වීම්හි  මිනිසා සහ පරිසරය අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාව පිළිබඳ සඳහන් වන සූත්‍ර ධර්මයන්  හා භික්ෂු විනය ශික්ෂා මගින් පරිසර හිතෛෂී වීමට ද සෞන්දර්ය වර්ණනා තුළින් පරිසරය හා මිනිසා අතර පවතින සබදතාව මනාව විස්තර කෙරේ. මිනිස් චින්තනයෙහි පවතින යහපත් සිතුවිලිවලින් පාරිසරික සහනයත් එමගින් නීති ගරුක වීමත් අයහපත් සිතුවිලි තුළින් පාරිසරික ව්‍යසනයන් ඇතිවීමත් එමගින් නීති ගරුක නොවීම හා පරිසර විනාසයත් සිදුවන බව මනාව සඳහන් වේ. භික්ෂූන්ගේ දෛනික ජීවිතයේ පරිහරණය කරනු ලබන සියලුම දෑ පරිසර හිතකාමී වන අයුරින් පරිහරණයටත් බුදු දහම මග පෙන්වයි. පරිසරය යන්නට පුළුල් අර්ථයක් පවතින අතර එය සෑම දෙයක ම පැවැත්ම හෝ නැවැත්ම තීරණය කරන්නා වූ ප්‍රධානතම විශ්ව සාධකයක් ද වේ. වඩාත් පුළුල් අර්ථයකින් සළකා බලන කල්හි ජීවවිද්‍යාත්මක, රසායනික, භෞතික, සමාජ හා සංස්කෘතික සාධක සියල්ල පරිසරය යන්නට ඇතුළත් වේ. ජීවවිද්‍යාත්මක පරිසරය යන්නට ශාක හා සත්ව විශේෂයන් ද භෞතික පරිසරයට පස, ජලය, වාතය ආදිය ද සමාජ පරිසරයට මිනිසා විසින් නිර්මාණය කරන ලද ගොඩනැගිලි ආදී ක්‍රියාකාරකම් ද සංස්කෘතික පරිසරයට ආචාර ධර්ම, නීති පද්ධති  ද අන්තර්ගත වේ. මානව සංවර්ධනය හා පරිසර කළමනාකරණය අතර අන්‍යෝන්‍ය සබඳතාව කෙරෙහි සැලකිලිමත් වීම ප්‍රායෝගික ලෙස නිවරදි වූ බෞද්ධ ආකල්ප තුළ ද පිහිටා බුදුදහම හා විනය ශික්ෂා අනුගමනය කරමින් අධික ඇල්ම, තණ්හාව, ද්වේශය දුරලමින් පරිසර සංරක්ෂණයට පිවිසීම බුද්ධ දේශනාව මඟින් ගම්‍යමාන වේ.

***ප්‍රමුඛ පද:*** පරිසර සංරක්ෂණය, බුදුදහම, බෞද්ධ ආචාර ධර්ම, ස්වභාවදහම, ස්වභාවික සම්පත්

[1] බෞද්ධ සංස්කෘතිය(විශේෂවේදි), තෙවන වසර, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. badalkuburesubodhithero2020@gmail.com